ASSOCIATION FOR FRIENDSHIP AND LOVE (AFRIEL)

## මාධ්‍ය නිවේදනය

### එක්සත් ලංකාවක් සඳහා වූ තරුණ වීදිනාට්‍ය හා සංවාද වැඩසටහන

30 ඔක්තොම්බර් 2015

මිත්‍රත්වය සහ ආදරය සඳහා වන සහයෝගීතාවය (එෆ්රියල් තරුණ ජාලය) මානව අයිතිවාසිකම් සුරැකීමේ සහ ජනවාර්ගික අර්බුදයට දේශපාලන විසඳුමක් ප්‍රවර්ධනය කිරිම සඳහා උතුරු නැගෙනහිර පළාත් වල ක්‍රියාකාරි තරුණ සංවිධානයකි. එෆ්රියල් තරුණ ජාලය විසින් ජාතීන් අතර සහයෝගීතාවය ගොඩනැගීම අරමුණු කොට ගෙන රට පුරා  සහ සංවාද ඇතුලත් වැඩසටහන් මාලාවක් ක්‍රියාවට නගමින් සිටී. මෙම වීදි නාට්‍ය ඇතුලත් සංවාද මාලාව උතුරු නැගෙනහිර යුද්ධයෙන් විපතටපත් තරුණ තරුණියන්ගේ ස්වෙච්ඡා දායකත්වයෙන් සිදුවන්නකි. මෙම වීදි නාට්‍ය ඇතුලත් සංවාද මාලාව තුළ රටේ යුද්ධයෙන් විපතටපත්වූවන් අතර අවබෝධය ගොඩනැගීම අරමුණු කොට නිර්මාණය කර ඇත.

පසුගිය දින 11 ක් පුරා යාපනය , කිලිනොච්චිය, මන්නාරම ,ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, නුවරඑළිය, බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි ජනතාව අතරට ගොස් පුළුල් සංවාදයක් ගොඩනගන ලදී. මෙම වැඩසටහන නොවැම්බර් මැදභාගයේදී උතුරු නැගෙනහිර වතුකරයේ ජනතාවගේ අදහස් රැගෙන නුවර, මාතලේ, හම්බන්තොට, මාතර, ගාල්ල , කළුතර, කොළඹ, ගම්පහ, කුරුණෑගල දිස්ත්‍රික්ක වල ජනතාව සමග අවබෝධාත්මක සංවාද මාලාවක් වෙත යොමුවීමට අපේක්ෂා කෙරේ.

මෙම වැඩසටහනෙහි ප්‍රධාන අංගයක් වන වීදි නාට්‍ය රංගන අංශ කිහිපයකින් සමන්විත වේ. වීදි නාට්‍යයේ පළමු අදියරේදි විවිධ ජාතින් ජීවත් වන ගම්මානයක වැසියන්ගේ ගැටළු සඳහා හේතු වූ මූලාරම්භයන් පිළබඳව සංවාදයට ලක් කෙරෙන අතර දෙවන අදියරේදී ගැටළු සඳහා විසඳුම් සොයාගැනීමට එකිනෙකාට උපකාර නොවීමත් දේශපාලන මැදිහත්වීම් හේතුවෙන් සමාජය පත්වූ අසරණ තත්ත්වය පිළබඳව සාකච්ඡා කෙරේ. නාට්‍යයේ අවසාන අදියරේදී ජාති ආගම් අතර භේදයකින් තොරව පවතින ගැටළු සඳහා විසඳුම් සෙවීමේ වැදගත්කම පෙන්වා දේ.

අවාසනාවන්ත ලෙස රටේ ජාතින් අතර සහයෝගීතාවය ගොඩනැගීම උදෙසා වන අපගේ උත්සහයට හමුදා සහ පොලිස් නිලධාරින්ගෙන් බාධා එල්ල වී ඇත. මුලතිව් දිස්ත්‍රික්කයේ කේපාපලෙයි , තන්නිමුරිප්පු ප්‍රදේශ වලදීද , කිලිනොච්චි දිස්ත්‍රික්කයේ කිලිනොච්චි නගරයේදී සහ ස්කන්ධපුරම් ප්‍රදේශයේදී ද මන්නාරම දිස්ත්‍රික්කයේ අඩම්පන් ප්‍රදේශයේදී ද හමුදා හෝ පොලිස් නිලධාරින්ගේ බාධා එල්ල විය. මෙවන් මැදිහත්වීම් සහ වැඩසටහන සඳහා හමුදාවන්හි අනුමැතිය  අවශ්‍ය බව පැවසීම අප තරයේ හෙළාදකිමු.

අපගේ සමාජ ක්‍රියාකාරිත්වයට එල්ල වන මෙවන් බාධා සහ උතුරේ ජනතාවගේ ප්‍රශ්න වලට විසඳුම් වෙනුවට ලබා දෙන හිස් පොරොන්දු පිළිබඳ යුද වින්දිත තරුණයින් ලෙස අප තරයේ අප්‍රසාදය පළ කරන්නෙමු. එලෙසම රජයේ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පාරදෘශ්‍යබවින් යුතු එකක් විය යුතු යැයිද එකී ක්‍රියාවලියට පුරවැසි සහභාගීත්වයක් තිබිය යුතු යැයිද අප තරයේ විශ්වාස කරන්නෙමු. එසේම උතුරු නැගෙනහිර සිවිල් සමාජ ක්‍රියාකාරිත්වය සීමා නොවනු ඇතැයි ද ජාතීන් අතර සහයෝගීතාවය ගොඩනැගීම සඳහා සිවිල් සමාජ ක්‍රියාකාරිත්වයන්ට ඉඩ කඩ රජය විසින් නිර්මාණය කරනු ඇතැයිද අපි විශ්වාස කරන්නෙමු.

කෙසේ වෙතත් පැමිණි බාධක සහ අභියෝගයන් හමුවේද පසුගිය දින කිහිපය තුළ 4000 අධික ජනතාවක් ඔවුන්ගේ ගැටළු අදහස් මෙම සංවාදය හා එක් කළ අතර ජනවාරි 8 වෙනදායින් පසු රජය නොදුටුවා සේ සිටින ගැටළු බොහෝමයක් අප දුටුවෙමු. මෙම වැඩසටහන තුළින් වින්දිතයින්ට යුක්තිය ඉටු කිරිම සඳහා වන හඬක්  සිවිල් සමාජය තුළින් ගොඩනැගෙනු ඇතැයි ද ඒ තුළින් ජාතීන් අතර සහයෝගීතාවය ගොඩනැගීමට නවමු අවකාශයක් නිර්මාණය කරනු ඇත.

උතුරු නැගෙනහිර සහ වතුකරයේ ජනතාවගේ දුක් වේදනා පිරි අදහස් ද කැටිට දකුණ සමග අවබෝධාත්මක සංවාදයකට අපි නොවැම්බර් මැද දකුණට පැමිණෙන්නෙමු.

Postal Address: No.28, Kailasa Pillayar Road, Nallur, Jaffna, Sri Lanka.

Contact No: +94(0)214927336 / +94(0)214927336

Fax: +94(0)212216088

Email: afrielangelofyouth@gmail.com

Website: [https://www.afrielyouthnetwork.org](https://www.afrielyouthnetwork.org)

Re No. GL 2314

ASSOCIATION FOR FRIENDSHIP AND LOVE (AFRIEL)

පැමිණෙන සියළු බාධක හා අභියෝගයන් නොතකා සමාජයේ අවධානය ගිලිහෙමින් යන අසරණ ජන කොටස් බලාත්මක කොට ඔවුන්ගේ අයිතිවාසකම් සුරක්ෂිත කිරිම උදෙසා ද එකසත් ලාංකික සමාජයක් ගොඩනැගීම උදෙසාද අප ක්‍රියාකාරිත්වය අඛණ්ඩව ක්‍රියාත්මක කරන්නෙමු.

රවීන්ද්‍ර ද සිල්වා
එෆ්රියල් කණ්ඩායම් සමාජික

Postal Address: No.28, Kailasa Pillayar Road, Nallur, Jaffna, Sri Lanka.

Contact No: +94(0)214927336 / +94(0)214927336

Fax: +94(0)212216088

Email: afrielangelofyouth@gmail.com

Re No. GL 2314

Website: https://www.afrielyouthnetwork.org